සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

நலன்புரி நன்மைகள் சபை

WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

Ministry of Finance, Economic Stabilaization & National Policies

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 11 . 01. 2023 |

සියලු ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් හඳුනාගැනීම - 2022**
**දත්ත රැස්කිරීමට විකල්ප ක්‍රමයක් යොදා ගැනීමේ ශක්‍යතා අධ්‍යනය**

2002 අංක 24 දරණ සුබසාධන ප්‍රතිලාභ පනතේ විධිවිධාන අනුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීම් පිණිස සුදුසු තැනැත්තන් හඳුනාගැනීමේ 2022 වැඩසටහන (සමාජ ලේඛනය සකස් කිරීම) දැනටමත් ආරම්භ කර ඇත. ඒ අනුව ප්‍රතිලාභ අපේක්ෂා කරන්නන්ගේ අයදුම්පත් මිලියන 3.72 ක් තොරතුරු පද්ධති ගත කර ඇත.

මෙම ක්‍රියාවලියෙහි මීළඟ අදියර ලෙස දැනටමත් ලියාපදිංචි වී ඇති අයදුම්කරුවන්ගේ නිවෙස්වලට ගොස් ප්‍රතිලාභ ලබා ගැනීමට ඔවුන් සතු සුදුසුකම් පරීක්ෂාකිරීම සඳහා ජංගම පරිගණක මෘදුකාංගයක් මඟින් අයදුම්කරුවන් ගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට සැලසුම් කර ඇත. මේ සඳහා ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සඳහා යොදවා ගැනීමට අපේක්ෂා කළ නිලධාරීන් විසින් අවසන් වශයෙන් පනතේ 21 සහ 22 වගන්ති සංශෝධනය කළ යුතුවීම සහ "පුද්ගලික ජංගම දුරකථන භාවිතයට බල කිරීම" යන කරුණු උපුටා දක්වමින් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් මෙම කාර්යය කාර්යක්ෂම ලෙස ඉටු කරගැනීමට නොහැකි වී තිබේ. මේ හේතුවෙන් 2022 දෙසැම්බර් මස 31 දිනට දත්ත රැස්කිරීම අවසන් කිරීමට අපේක්ෂිතව තිබූ ඉලක්කය සපුරාගැනීමට නොහැකි විය.

2023 ජනවාරි 10 වන දින පැවති පාර්ලිමේන්තු රාජ්‍ය මූල්‍ය කාරක සභාවේ නිරීක්ෂණ පරිදි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය පහසුකම් ලබා ගැනීම සඳහා මෙම ඉලක්කය සපුරා ගැනීම අත්‍යවශ්‍ය වී ඇති බැවින් මාර්තු 31 දින වනවිට හෝ ඊට පෙර මෙම දත්ත රැස්කිරීම අවසන් කරන ලෙස රාජ්‍ය මූල්‍ය කාරක සභාව විසින් උපදෙස් ලබාදෙන ලදී.

ඒ අනුව දැනට ඔබගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් කාර්යය පැවරුම පදනම මත ජංගම දුරකථන මෘදුකාංගය භාවිතා කරමින් දත්ත රැස්කිරීමට යොදවාගත හැකි නිලධාරීන් හඳුනාගෙන මෙම කාර්යය ඉටුකිරීමට බලාපොරොත්තු වේ. එබැවින් එවැනි තැනැත්තන් ග්‍රාම වසම් නිලධාරී මට්ටමින් හඳුනාගත හැකිද හා ඒ අනුව මෙම කාර්යය ඉටු කළ හැකිද යන්න නිශ්චය කර ගැනීම මෙම මූලික අධ්‍යනයෙන් අපේක්ෂා කෙරේ.


කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411- 2151481, 009411- 2484600/4117, Fax: 009411- 2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk

ඒ අනුව මෙම ගුහල් සබැඳිය සමඟ ඇති ප්‍රශ්නාවලිය - https://forms.gle/T8RVUTdDzDT8GJZ27 හැකි ඉක්මනින් සම්පූර්ණ කර අප වෙත එවන ලෙස ඉතා කාරුණිකව දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් ඔබෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

බී.විජයරත්න
සභාපති/කොමසාරිස්

පිටපත - සියලු දිසාපති /දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත